සියලුම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

33 | S | I

## Grade 11 - Diagnostic Test– August 2022

අනාවරණ පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2022 අගෝස්තු

කාලය : පැය 1
Time: 1 hour

## ඉතිහාසය I

Name: - ................................................................ class: -.................. Index no: - ........................

සැලකිය යුතුයි

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් දී ඇති 1 , 2, 3, 4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැළකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

1. මහා වංශය රචනා කිරීමේදී තොරතුරු සපයා ගත් කෘතියක් නො වන්නේ පහත සඳහන් කුමන පිළිතුරද?
(1) වංසත්ථප්පකාසිනිය (2) විනයට්ඨ කතා
(3) උත්තර විහාරට්ඨකථා (4) සිහලට්ඨකථා

2. අනුරාධපුර රාජධානි සමයේ සිට කෝට්ටේ රාජධානිය සමය දක්වා ලියැවුණු සාහිත්‍ය කෘතීන් සම්බන්ධව වඩාත් ගැලපෙන ප්‍රකාශය වන්නේ,
(1) ආගමික අරමුණු පදනම් කරගෙන කර ගෙන ලියැවී ඇත
(2) දේශපාලන අරමුණු පදනම් කරගෙන කර ගෙන ලියැවී ඇත
(3) පාලි භාෂාවෙන් පමණක් ලියැවුණු කෘතීන් දක්නට ලැබේ
(4) වංශකතා පමණක් ලියැවී ඇත.

3. මෙරටින් හමු වූ මුල්කාලීන සෙල්ලිපි ලියැවී ඇත්තේ,
(1) බ්‍රාහ්මී අක්ෂර වලින්ය (2) සංස්කෘත භාෂාවෙනි
(3) ද්‍රවිඩ භාෂාවෙනි (4) හෙළ බසිනි

4. මානව ඉතිහාසයේ අධික වර්ෂාපතනයක් පැවති කාලය හැඳින්වූයේ,
(1) හොලෝසීන යුගය ලෙස ය (2) ප්ලයිස්ටෝසීන යුගය ලෙසය
(3) මුල් ඓතිහාසික යුගය ලෙසය (4) සංක්‍රාන්ති යුගයක් ලෙස ය

5. රාවණා ඇල්ල ගල්ලෙන සහ කිතුල්ගල බෙලිලෙන අයත්වෙන පරිසර කලාප දෙක පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
(1) පහත රට තෙත් කලාපය සහ උඩරට වියළි කලාපය
(2) අර්ධ ශුෂ්ක කලාපය සහ පහත රට වියළි කලාපය
(3) පහත රට තෙත් කලාපීය සහ කඳුකර එළිමහන් වාසස්ථාන
(4) උඩරට වියළි කලාපය සහ තෙත් කලාපය

6. මුල් ඓතිහාසික යුගය වශයෙන් සලකනු ලබන කාලපරිච්ඡේදය වන්නේ,
(1) ක්‍රිස්තු පූර්ව 750 - 450 අතර කාලය
(2) ක්‍රිස්තු පූර්ව 1800 - 450 අතර කාලය
(3) ක්‍රිස්තු පූර්ව 450- ක්‍රිස්තු වර්ෂ 300 අතර කාලය
(4) ක්‍රිස්තු පූර්ව 125,000 - 1800 දක්වා කාලය

7. වසර 125 000 ක ට පෙර මෙරට විසූ ප්‍රාග් ඓතිහාසික මානවයන්ගේ ගල් මෙවලම් පිළිබඳ තොරතුරු ලැබී ඇත්තේ
(1) මිනිහා ගල්කන්ද (2) පතිරාජවෙල
(3) පාහියන්ගල (4) කිතුල්ගල බෙලිලෙන



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

8. මෙරට ප්‍රථම සංවිධානාත්මක සටන් ව්‍යාපාරයක් ගෙනගිය රජු ලෙස සලකනු ලබන්නේ
(1) පළමු වන විජයබාහු රජතුමා
(2) දුටුගැමුණු රජතුමා
(3) වළගම්බා රජතුමා
(4) දෙවන පරාක්‍රමබාහු රජතුමා

9. පැරණි රජවරුන් ජනතාව දැනුවත් කිරීම සඳහා පනවන ලද විවිධ නීති රීති ඇතුළත් සෙල්ලිපි කිහිපයක් I ද ඒවායේ ඇතුළත් වූ තොරතුරු 11 තීරුවේ ද සඳහන් වෙයි. 1 තීරුවේ අනුපිළිවෙල අනුව 11 තීරුව ගැ නිවැරදි පිළිතුර කුමක්ද?

| 1 තීරුව | 11 තීරුව |
|---|---|
| 1. මිහින්තලා පුවරු ලිපිය | A. වෙළඳපළක පාලනය සම්බන්ධ නීති රීති |
| 2. බදුලු ටැම් ලිපිය | B. පරිසරය හා කෘෂිකර්මය සම්බන්ධ නීති රීති |
| 3. ගොඩවාය සෙල්ලිපිය | C. විහාරාරාම පාලනය පිළිබඳ නීතිරීති |
| | D. නැව් තොටකින් අය කළ තීරු බදු |

(1) B A D (2) A C D (3) C A D (4) A B C

10. ශිලා ලේඛන වලින් හෙළිවන තොරතුරු අනුව මෙරට බදු අයකිරීම විධිමත් හා ක්‍රමවත් කළ රජතුමා වන්නේ
(1) නිශ්ශංකමල්ල රජතුමා
(2) වසභ රජතුමා
(3) පණ්ඩුකාභය රජතුමා
(4) දුටුගැමුණු රජතුමා

11. නගර වුඩික හා කනපෙඩික යන පැරණි සමාජයේ රාජ්‍ය සේවයට සම්බන්ධ නිලධාරීන් දෙදෙනාගේ කාර්යයන් පිළිවෙලින් ,
(1) නගරයේ වෙළඳ කටයුතු හා භෝජන ශාලාව පාලනය කිරීම
(2) නගරාධිපති හා වත් සිරිත් චාරිත්‍ර පිළිබඳ අධිකාරි
(3) නාගරික වාස්තු විද්‍යාඥ හා රාජ්‍ය ලේඛනාගාරය භාරව කටයුතු කිරීම
(4) කාසි අච්චු ගැසීම භාර නිලධාරියා හා නගරයේ ප්‍රධාන වාස්තු විද්‍යාඥයා

පහත දැක්වෙන වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| සෙල්ලිපිය | ශිල්පියාගේ නම |
|---|---|
| A. මණ්ඩගල | D. මජ්ජිම |
| B. මුතුගල්ල | E. තුලදර සුමන |
| C. වේගිරිය දේවාලය | F. දටික සුමන |

12. රන් කර්මාන්තයේ නිරත වූ ශිල්පියකු පිළිබඳ තොරතුරු ඇතුළත් පිළිතුර වන්නේ,
(1) A හා E (2) A හා F (3) A හා D (4) B හා D

13. ඉන්දියන් සාගරයේ ජාත්‍යන්තර වෙළෙඳාම නැගෙනහිර දෙසට ව්‍යාප්ත වූ පසු මෙරට වැදගත්ම වෙළඳ වරාය බවට පත්වූයේ,
(1) ගෝකණ්ණතිත්ථ වරාය
(2) මහාතිත්ථ වරාය
(3) ගොඩවාය වරාය
(4) ගිම්හතිත්ථ වරාය

14. A. පළමුවන විජයබාහු රජු චෝලයින් පළවා හැරීම
B. කාශ්‍යප රජු සීගිරිය බලකොටුව ඉදි කිරීම
C. ඉබන් බතුතා මෙරටට පැමිණීම
D. කාලිංග මාඝගේ ආක්‍රමණය

• ඉහත සිදුවීම් කාල අනුපිළිවෙලට ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ
(1) A B D C (2) B A D C (3) D B A C (4) B A C D


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

23. කෝට්ටේ රාජධානිය හා සම්බන්ධ තොරතුරු පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) B සහ E (2) C සහ E (3) A සහ D (4) C සහ D

24. උඩරට රාජ්‍යය අත්පත් කර ගැනීමට පෘතුගීසීන් මෙහෙයවූ සටන් අතුරෙන් කපිතාන් ජනරාල් කොන්ස්තන්තීනු ද සා මෙහෙයවනු ලැබුවේ,

(1) බලන සටන
(2) රන්දෙනිවල සටන
(3) ගන්නෝරුව සටන
(4) දන්තුරේ සටන

25. යාපනයේ රාජ්‍යය බිඳවැටීමට හේතු වූ පහත සඳහන් ප්‍රකාශ අතුරින් සාවද්‍ය ප්‍රකාශය කුමක්ද ?

(1) රාජ්‍ය උරුම කරුවන් අතර ඇති වූ බල අරගලය
(2) රාජ්‍ය පාලකයාට නිත්‍ය හමුදාවක් නොසිටීම
(3) යාපනයේ රාජ්‍යයට ස්වාභාවික ස්වභාවික ආරක්ෂාවක් නොතිබීම
(4) යාපනය ජනතාව පෘතුගීසීන්ට පක්ෂපාතී වීම

- 26 සහ 27 යන ප්‍රශ්නවලට පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.

A. පන්සිය පනස් ජාතකය
B. නිකාය සංග්‍රහය
C. සිංහල බෝධි වංශය
D. පූජාවලිය
E. බුදුගුණාලංකාරය
F. කව්සිළුමිණ

26. ඉහත දැක් වූ සාහිත්‍ය ග්‍රන්ථ අතුරින් දඹදෙණිය රාජධානි සමයේ ලියැවුණු ග්‍රන්ථ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) D සහ F (2) A සහ D (3) A සහ E (4) C සහ B

27. ඉහත දැක්වූ සාහිත්‍ය ග්‍රන්ථ අතුරෙන් කුරුණෑගල රාජධානි සමයේ ලියවුණු ග්‍රන්ථ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A සහ C (2) B සහ C (3) A සහ F (4) C සහ

28. ඉංග්‍රීසින් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් අත්පත් කර ගන්නා විට උඩරට පාලකයාව සිටියේ,

(1) රාජාධි රාජසිංහ රජතුමා
(2) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා
(3) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා
(4) ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා

29. 1818 නිදහස් අරගලය පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් අතුරෙන් නිවැරදි නොවන ප්‍රකාශය කුමක්ද?

(1) සටනට නායකත්වය ලබාදුන්නේ උඩරට රදළ ප්‍රධානීන් විසිනි.
(2) සටන මැඩ පැවැත්වීමට ඉංග්‍රීසිහු දැඩි මර්දනකාරී ක්‍රියා මාර්ගයක් අනුගමනය කළහ.
(3) සටන්කරුවන් රජු ලෙස පිළිගත් දොරේසාමි, රාජාධිරාජසිංහ රජුගේ ඥාතියෙක් විය.
(4) නිදහස් අරගලය අවස්ථාවේ ඉංග්‍රීසීන්ට පක්ෂපාතී වූ රදළයින්ට විවිධ වරප්‍රසාද ලැබුණි.

30. උඩරට රාජධානියේ ස්වාධීන සංවිධානයක් ව තිබී පසුව පරිපාලන සංවිධානයක් වූයේ,

(1) බද්දේ කාර්යාංශය
(2) රට වසම කාර්යාංශය
(3) මහවාසළ කාර්යාංශය
(4) විහාර හා දේවාල කාර්යාංශය

31. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් පොන්නම්බලම් අරුණාචලම් මහතා පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක්ද?

(1) 1919 වර්ෂයේ දී සිංහල නායකයින් සමග එක්ව ලංකා ජාතික සංගමය පිහිටුවීමට කටයුතු කිරීම
(2) 1915 වර්ෂයේ දී ඉංග්‍රීසි ආණ්ඩුව බෞද්ධයින්ට එරෙහිව මර්දනකාරී ක්‍රියා මාර්ගයක් ගත් විට ඊට එරෙහිව කටයුතු කිරීම
(3) යාපනයේ ශිවන්ගල විද්‍යාලය ආරම්භ කිරීම
(4) ව්‍යවස්ථාදායක සභාවට පත් වූ ප්‍රථම උගත් ශ්‍රී ලාංකිකයා වීම


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

15. මෙරට ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය දියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත් රජවරුන් අතරින් රෝහල් 18ක් ඉදි කළ රජ කෙනෙකු ලෙස ඉතිහාසගත වන්නේ,

(1) බුද්ධදාස රජතුමා
(2) පණ්ඩුකාභය රජතුමා
(3) දුටුගැමුණු රජතුමා
(4) පළමුවන උපතිස්ස රජතුමා

16. අතීතයෙහි මෙරට වී ගොවිතැන දියුණුව පැවති බවට තොරතුරු ලැබෙන මූලාශ්‍රය ලෙස සැලකිය හැකි වන්නේ,

(1) කොණ්ඩවට්ටවාන් සෙල්ලිපිය
(2) අනුරාධපුර පුවරු ලිපිය
(3) තෝනිගල සෙල්ලිපිය
(4) බුද්දන්නේහෙල සෙල්ලිපිය

17. පහත A තීරුවේ සිදුවීම් B තීරුවේ සඳහන් රජවරුන් සමග ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ

| A | B |
|---|---|
| (1) චීනය සමග තානාපති සබඳතා පැවැත්වීම | A. පළමුවන බුවනෙකබාහු රජතුමා |
| (2) ඊජිප්තුවේ සුල්තාන්වරයා සමග වෙළඳ සබඳතා ඇතිකර ගැනීම | B. පළමුවන ගජබාහු රජතුමා |
| (3) වීදුරු පබළු ගෙන ඒමට රෝමයට දූතයින් යැවීම | C. හයවන අග්ගබෝධි රජතුමා |
| (4) දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට චේර දේශයට යාම | D. භාතිකාභය රජතුමා |

(1) C A D B
(2) A C D B
(3) B C A D
(4) A B C D

18. වර්තමානයේ ජලාශයක් ඉදිකිරීමට යාමේ දී හමුවූ ,දැනට සංරක්ෂණය කර ඇති, සුවිශේෂී වාරි තාක්ෂණ නිර්මාණය කුමක්ද?

(1) පරාක්‍රම සමුද්‍රයේ බිසෝකොටුව
(2) මාදුරු ඔය සොරොව්ව
(3) සීගිරිය මහවැවේ බැම්ම
(4) යෝධ ඇළේ වැව් බැම්ම

19. ශ්‍රී ලංකාවේ වරායන් ආශ්‍රිතව බිහිවූ නගර හැඳින්වූයේ,

(1) පට්ටන ගම
(2) නියම් ගම්
(3) ඔළගම්
(4) පරික්ඛිත්ත ගම්

20. පහත ප්‍රකාශ අතුරෙන් පොළොන්නරුව රාජධානිය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය වන්නේ

(1) කලා නිර්මාණවල හින්දු ආගමික බලපෑම දැකගත හැකිය
(2) පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට හේතු වූයේ කාලිංග මාඝගේ ආක්‍රමණ යයි
(3) පළමුව පොළොන්නරුව පාලන මධ්‍යස්ථානයක් ලෙස තෝරා ගනු ලැබුවේ චෝලයින් විසිනි
(4) පොළොන්නරු රාජධානි සමය වන විට ඉන්දියන් සාගරයේ අන්තර්ජාතික වෙළඳාම බටහිර දෙසට ව්‍යාප්ත වී පැවතුණි.

21. පහත දැක්වෙන රාජ්‍ය පාලක පාලිකාවන් අතරින් පොළොන්නරු රාජධානියට අයත් පාලක පාලිකාවන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

A. ධාතුසේන රජතුමා
B. සහස්ස මල්ල රජු
C. පලමුවන ගජබාහු රජතුමා
D. පරාක්‍රම පාණ්ඩ්‍ය රජු
E. ලීලාවතී බිසව
F. පළමුවන උපතිස්ස රජු

(1) B E F
(2) B D E
(3) B C F
(2) A B C

A සිට E දක්වා ඇති තොරතුරු ඇසුරෙන් 22, 23 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. චීන ආක්‍රමණයක් සිදු වීම
B. දළදා වහන්සේ පාණ්ඩ්‍ය රජු විසින් පැහැර ගැනීම
C. සිංහල සංගෙ නමින් කැරැල්ලක් ඇතිවීම
D. බලවත් ප්‍රභූ පවුල් දෙකක් රාජ්‍ය පාලනයට සම්බන්ධ වීම
E. අවසන් වතාවට යාපනේ රාජ්‍ය ප්‍රධාන රාජ්‍යයට යටත් වීම

22. ගම්පල රාජධානිය හා සම්බන්ධ තොරතුරු පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) A සහ D
(2) A සහ C
(3) C සහ E
(4) B සහ E



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub

32. මිෂනාරි සමාගම් මගින් ආරම්භ කළ අධ්‍යාපන ආයතනවලට එරෙහිව දේශීය අධ්‍යාපනය නගා සිටුවීමට ගත් වැදගත්ම ක්‍රියාමාර්ගය වූයේ,

(1) ස්වභාෂා අධ්‍යාපනය ලබාදෙන පාසල් පිහිටුවීම
(2) ඉරුදින දහම් පාසල් පිහිටුවීම
(3) ඉංග්‍රීසි මාධ්‍ය බෞද්ධ පාසල් පිහිටුවීම
(4) විදේශ රටවලට දරුවන් යවා උසස් අධ්‍යාපනය ලබාදීම

33. A ප්‍රබන්ධ කතා රචනා කරමින් දේශීය සංස්කෘතිය නගා සිටුවීමට කටයුතු කිරීම
B බෞද්ධ නාට්‍ය රචනා කිරීම මගින් දේශීය සංස්කෘතිය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම

ඉහත කාර්යන්හි නිරත වෙමින් මෙරට ජාතික පුනරුද ට එක් වූ නායකයින් දෙදෙනා පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
(1) වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා හා ඩබ්ලිව්. ඒ ද සිල්වා මහතා
(2) පියදාස සිරිසේන මහතා සහ නිතිඥ ජෝන් ද සිල්වා මහතා
(3) එස්. මහින්ද හිමියන් සහ පියදාස සිරිසේන මහතා
(4) වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා සහ අනගාරික ධර්මපාල තුමා

34. පුනරුද සමයේ චිත්‍ර කලාවේ ඇති වූ වැදගත්ම වෙනස ලෙස සැලකිය හැකි වන්නේ,
(1) ශිල්ප ශ්‍රේණි ලෙස සංවිධානය වී කලා නිර්මාණ එළි දැක්වීමයි
(2) ආගමික වශයෙන් වැදගත් වූ පුද්ගලයින්ගේ රූප පමණක් චිත්‍රයට නැගීම යි
(3) ලෞකික රසවින්දනයට හා ස්වාභාවිකත්වයට මුල්තැන දෙන නිර්මාණ බිහි වීමයි
(4) කලා නිර්මාණ වලට අනුග්‍රහය දැක්වීමට ධනවතුන් මැලි වීමයි

5. පුනරුද සමයේ විවිධ සොයාගැනීම් කළ පුද්ගලයින් අතුරෙන් එංගලන්ත ජාතික අයිසෙක් නිව්ටන් ඉතිහාසගත වන්නේ,
(1) ගුරුත්වාකර්ෂණය සොයා ගැනීම නිසාය
(2) නූතන තාරකා විද්‍යාවේ පියා ලෙසය
(3) අත්හදාබැලීමේ පියා ලෙසය
(4) රුධිර සංසරණ පද්ධතිය පිළිබඳ තොරතුරු ලොවට හෙළි කිරීම නිසාය

පහත දැක්වෙන A .B ප්‍රකාශ ඇසුරෙන් 36 වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A. ලිබරල් වාදය සමාජ වාදය වැනි දේශපාලන දර්ශන බිහිවිය
B. ජාතික රාජ්‍ය බිහිවී නැවතත් බලය රජු වටා කේන්ද්‍රගත විය.

;. කාර්මික විප්ලවයේ ප්‍රතිඵල ලෙස,
(1) A හා B සත්‍ය වේ
(2) A හා B අසත්‍ය වේ
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වෙයි
(4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ

. යුරෝපීය උගතුන් වූ රිස් ඩේවිඩ් , හෙන්රි පාකර්, ජෝර්ජ් ටර්නර්, එච්. සී. පී. බෙල් යන අය අපට වැදගත් වන්නේ,
(1) ඔවුන් මෙරට මෙරට ඓතිහාසික මූලාශ්‍ර ආරක්ෂා කිරීම සඳහා ඉදිරිපත්වීම නිසාය .
(2) බුදු දහම පිළිබඳ කෘතින් රචනා කිරීම නිසාය
(3) මිෂනාරි සංවිධානවල ආගම් ප්‍රචාරක කටයුතු වලට උපකාර කිරීම නිසාය
(4) මෙරට ප්‍රථම ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයින් වීම නිසාය .


iexamhub www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

- පහත A, B, C, D යනුවෙන් දක්වා ඇති ප්‍රකාශ යුගලයන්හි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්...
පරීක්ෂාකර 38 සිට 40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A. 1. ෆර්ඩිනන්ඩ් රජු හා ඉසබෙලා රැජින
2. දේශ ගවේෂණය

B. 1 ජොහැන්ස් ගුටෙන්බර්ග්
2. ලෙඩ රෝග සෑදීමට තුඩුදෙන හේතු සොයා බැලීම

C. 1. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ
2. ගම් සභාව

D. 1. 1797 බදු විරෝධී අරගලය
2. අමුමිල්දාර්වරු

38. පළමුවැන්න දෙවැන්න බිහිවීමට හේතු වූ බව දැක්වෙන යුගලය,
(1) A (2) B (3) C (4) D

39. පළමුවැන්න හා දෙවැන්න අතර කිසිදු කිසිදු සම්බන්ධයක් නොපෙන්වන යුගලය,
(1) A (2) B (3) C (4) D

40. පළමු වැන්නේ බලපෑම නිසා දෙවැන්න අහෝසි වූ බව දැක්වෙන යුගලය,
(1) A (2) B (3) C (4) D



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

(සියලුම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

**Royal College - Colombo 07**

රාජකීය විද්‍යාලය - කොළඹ 07

| 33 | S | II |
|---|---|---|

## Grade 11 - Pre Evaluation Test– August 2022

අනාවරණ පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2022 අගෝස්තු

කාලය : පැය 3
*Time: 3 hours*

## ඉතිහාසය II

(Na)me: - ............................................................... class: -.................. Index no: - ........................

(උ)පදෙස්:

1 කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.

11 කොටසින් ප්‍රශ්න හතරකට ද, 111 කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න .පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව හයකි .

### 1 කොටස

(අ) (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.
කැලණිය, අනුරාධපුරය, සෙංකඩගල ,කලා වැව, මිණිපේ අමුණ, ඌරාතොට, ගොඩවාය,ලංකාපටුන, කුඹුක්කන් ඔය, තිරුකෝනේශ්වරම් කෝවිල, තිරියාය , කුදිරමලේ ( ලකුණු 12 යි)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.
බතාවිය ,මුම්බායි, පෘතුගාලය තායිවානය,කොන්ස්තන්තිනෝපල්,ලන්ඩන්

(ලකුණු 6 යි)

(ආ) පහත A,B,C,D යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට අදාළ පිළිතුරු අනුපිළිවලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A. අතීත ශ්‍රී ලංකාවේ දඬුවම් ක්‍රම පිළිබඳව දැක්වෙන සෙල්ලිපිය
B. ශ්‍රී ලංකාව ජනාවාස කළ ආදි කාලීන මානවයා
C. ලංකා පටුනෙන් මෙරටට වැඩම කළ පූජනීය වස්තුව
D. ක්‍රිස්තු වර්ෂ 1800 දී දී සිය යුධ ශක්තිය පෙන්වීමට උඩරට රාජ්‍යයට හමුදාවක් සමග ගමන් කළ බ්‍රිතාන්‍ය සෙන්පතිවරයා

(ලකුණු 4)

(ඇ) A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A



(i) 1. A රූපයෙන් දැක්වෙන ගොඩනැගිල්ල කුමක්ද?
2. මෙම නිර්මාණය පිහිටා ඇති ඓතිහාසික නගරය නම් කරන්න.
3. මෙය අයත් වන්නේ කුමන ආගමකට ද?
4. මෙම නිර්මාණය ගොඩනැගූ බවට සැලකෙනු ලබන්නේ මෙරටට පැමිණි කුමන විදේශීය ජන වර්ගයක්ද?

(ලකුණු 4 යි)

B



(ii) 1. B රූපයෙන් දැක්වෙන නිර්මාණය කුමක්ද?
2. එය නිපදවනු ලැබූ පුද්ගලයා නම් කරන්න.
3. ඔහු කුමන රටකට අයත් පුද්ගලයෙක් ද?
4. මෙම නිර්මාණය සමඟ දියුණුවට පත් වූ ක්ෂේත්‍රය කුමක්ද?

( ලකුණු 4යි)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

## 11 කොටස

2. (i) පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය බෙදෙන කොටස් තුනක් නම් කරන්න (ලකුණු 3යි)
   (ii) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පරිසර කලාප හතරක් නම් කරන්න. (ලකුණු 4යි)
   (iii) පූර්ව ඓතිහාසික යුගයේ මානවයා තාක්ෂණය භාවිතා කළ ආකාර දෙකක් නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 5යි)
   (iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස වල ව්‍යුහය හා ස්වරූපය කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6යි)

3. (i) අතීත රජවරුන් භාවිත කළ රාජ්‍යත්ව සංකල්ප තුනක් ලියන්න. (ලකුණු 3යි)
   (ii) පහත A, B, C ,D යටතේ අසා ඇති තොරතුරු අනුපිළිවෙළින් දක්වන්න.
   A. කලා වැවේ සිට තිසා වැව දක්වා ජලය ගෙන යාමට නිර්මාණය කළ ඇළ මාර්ගය
   B. වර්ෂා ජලයෙන් පෝෂණය වන වැව් පද්ධතිය හැඳින්වූ නම
   C. අඹන් ගඟ හරස් කර ඉදි කරනු ලැබූ ඇළ මාර්ගය
   D. වැවක එකතුවන රොන්මඩ ඉවත් කිරීමට සකස් කර තිබූ තාක්ෂණික අංගය (ලකුණු 4යි)

   (iii) වසභ රජතුමාගේ පාලන කාලයේ දී මහ වැව් ඉදි කිරීමට හේතු වූ කරුණු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 5යි)
   (iv) අතීතයේ මෙරට දියුණු වෛද්‍ය සේවාවක් පැවති බව කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6යි)

4. (i) ඇළහැර ඇළ මගින් ජලය සැපයූ වැව් තුනක් නම් කරන්න. (ලකුණු 3යි)
   (ii) පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් හා සම්බන්ධ රජවරු අනුපිළිවෙලින් ලියන්න.
   A. රාජත්වයට පත් පත් වී දස වන රාජ වර්ෂයේදී ග්‍රාම සීමා නියම කිරීම.
   B. මාඝාත නීතිය පැනවීම
   C. පරුමකවරුන් ට රාජ සභාවේ තනතුරු ලබාදී රාජ්‍ය පාලනයට එක් කර ගැනීම.
   D. පංචකකුධ භාණ්ඩ භාවිත කොට දෙවන වතාවටත් රාජාභිෂේකය ලබා ගැනීම. (ලකුණු 4යි)

   (iii) අතීතයේ මෙරට දියුණු වෙළදාමක් පැවති බව කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5යි)
   (iv) A. පැරණි සමාජයේ වැසියන් යකඩ නිස්සාරණය පිළිබඳ දැන සිටි බවට තොරතුරු ලැබෙන ස්ථාන දෙකක් දක්වන්න.
   B. ඉන් එක් ස්ථානයක යකඩ නිස්සාරණය සිදුකළ ආකාරය ලියන්න. (ලකුණු 6යි)

5. (i) 16 වන සියවසේ පෘතුගීසින් පැමිණෙන විට මෙරට තිබූ ප්‍රධාන රාජධානි තුන නම් කරන්න. (ලකුණු 3යි)
   (ii) දෙවන නාගරිකරණය ට අයත් නගර අතුරින්
   A. උස් කඳුවැටි ආශ්‍රිතව ඉදි කරනු ලැබූ පාලන මධ්‍යස්ථාන දෙකක්
   සහ
   B. ගංගා හා කඳු වැටි හා ආශ්‍රිතව ඉදි කරනු ලැබූ පාලන මධ්‍යස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 4යි)
   (iii) දෙවැනි නාගරිකරණයේදී ලංකා ආර්ථිකයේ සිදුවූ වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 5යි)
   (iv) පළමුවන විමලධර්මසූරිය රජතුමාගෙන් ඉටුවූ සේවාවන් තුනක් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 6යි)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(i) ක්‍රිස්තුවර්ෂ 1521 විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ රාජ්‍ය බෙදීගිය කොටස් තුන නම් කරන්න. (ලකුණු 3යි)

(ii) පහත A, B, C, D වලින් දක්වා ඇති ප්‍රකාශ වලට අදාළ පුද්ගලයින් අනුපිළිවෙළින් ලියන්න.

A. ක්‍රි.ව. 1505 මෙරටට පැමිණි පළමු පෘතුගීසි නාවිකයා
B. මහනුවර රාජධානියේ ආරම්භක පාලකයා
C. ආර්ය චක්‍රවර්ති පරපුරේ ආරම්භක රජු
D. උඩරට රාජධානියේ දේශපාලනික වශයෙන් රජුට පමණක් දෙවැනි වූ මහවාසල නිලධාරියා (ලකුණු 4යි)

(iii). දෙවන රාජසිංහ රජතුමාට දේශපාලනික වශයෙන් එල්ල වූ අභියෝග දෙකක් දක්වා ඒවා ජයගත් ආකාරය පැහැදිලි කරන්න (ලකුණු 5යි)

(iv). මහනුවර රාජධානියේ පරිපාලන කටයුතු සංවිධානය වී තිබූ අයුරු කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6යි)

(i) පහත A, B, C වලින් දැක්වෙන අවස්ථාවන්ට සම්බන්ධ පුද්ගලයින් අනුපිළිවෙළින් ලියන්න.

A. මෙරට ප්‍රථම බෞද්ධ මුද්‍රණාලය ආරම්භ කිරීම
B. පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන පිහිටුවීම
C.පානදුරා වාදයේ දී බෞද්ධයන් වෙනුවෙන් මුලිකත්වය ගැනීම (අකුණු 3යි)

(ii) හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා මෙරට ආගමික හා ජාතික පුනරුදය වෙනුවෙන් ඉටුකළ සේවාවන් හතරක් ලියන්න . (ලකුණු 4යි)

(iii) 1803 බ්‍රිතාන්‍ය උඩරට ආක්‍රමණය පරාජය වීමට හේතු 2 ක් දක්වා විස්තර කරන්න. (ලකුණු 5යි)

(iv) 1848 නිදහස් අරගලයට බලපෑ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ 3 ක් පැහැදිලි කරන්න. (ලකුණු 6යි)

---

## 111 කොටස

(i) යුරෝපයේ පුනරුදය ඇති වීමට බලපෑ හේතු තුනක් ලියන්න. ( ලකුණු 3 යි)

(ii) පහත දැක්වෙන සිදුවීම් හා සම්බන්ධ පුද්ගලයින් හා ස්ථාන අනුපිළිවෙළින් දක්වන්න.

A. ක්‍රිස්තු වර්ෂ 1453 තුර්කින් අත්පත් කරගත් වෙළඳ නගරය
B. පල්ලියේ ආධිපත්‍ය විවේචනය කළ ජර්මන් ජාතික දේවධර්මය ඉගැන්වූ මහාචාර්යවරයා
C. නාවික ගමන් වලට අනුග්‍රහය දැක්වූ පෘතුගාලයේ රජතුමා
D. පුනරුද සමයේ කලා නිර්මාණ නිසා ප්‍රසිද්ධියට පත් ඉතාලි නගරය ( ලකුණු 4යි)

(iii ) පුනරුදයට පසු බිහිවූ කලා නිර්මාණවල දක්නට ලැබුණු වෙනස්කම් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 5යි)

(iv) පුනරුදයත් සමග ඇතිවූ ඇතිවූ දේශගවේෂණයේ ප්‍රතිඵල තුනක් පැහැදිලි කරන්න. ( ලකුණු 6යි)

(i) කාර්මික විප්ලවය නිසා ප්‍රථමයෙන්ම දියුණුවට පත් කර්මාන්ත තුන නම් කරන්න. (ලකුණු 3යි)

(ii) කාර්මික විප්ලවය සමඟ බිහි වූ නව නිපැයුම් කිහිපයක් පහත දැක්වේ ඒවාට සොයාගත් පුද්ගලයින් අනුපිළිවෙළින් දක්වන්න.

A. දුවන නඩාව
B. ස්පිනිං ජෙනී යන්ත්‍රය
C. ආරක්ෂක ලාම්පුව
D. වාෂ්ප නිපදවීමේ උදුන (ලකුණු 4යි)

iii) කාර්මික විප්ලවය නිසා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුව කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5යි)

iv) කාර්මික විප්ලවයේ ප්‍රතිඵල තුනක් උදාහරණ දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6යි)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources